# පුරප්පාඩු

## රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

## සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් කාර්යශූර, ස්වයංගාමක, වෘත්තීය උන්නතිගාමී කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කළ හැකි අයවලුන් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සමග අත්වැල් බැඳ ගැනීම අපි අපේක්ෂා කරමු.

**සෑම අයදුම්කරුවෙකුම,**

(i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
(ii) තනතුරේ වගකීම් නිසිලෙස ඉටු කිරීමට සහ දිවයිනේ ´නෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි මනා ශාරීරික සහ මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
(iii) මනා චරිතයකින් යුක්ත අයෙකු විය යුතුය.

### (1) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - තත්ත්ව පාලන තනතුර - (HM 1-1)

**රාජකාරි:**

තත්ත්ව පාලන අංශයේ ප්‍රධානී සහ තත්ත්ව පාලනයට අදාළ සියලු කටයුතු සඳහා සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ සහ සාමාන්‍යාධිකාරී වෙත වගකිව යුතුය.

1. රසායනාගාර කාර්ය මණ්ඩලයේ කටයුතු සංවිධානය කිරීම සහ අධීක්ෂණය කිරීම.
2. බෙදා හැරීම සඳහා සියලුම සංරචක, ඖෂධ නිෂ්පාදන බහාලුම්, වසා දැමීම්, සැකසෙමින් පවතින ද්‍රව්‍ය, ඇසුරුම් ද්‍රව්‍ය, ලේබල් සහ නිමි ඖෂධ නිෂ්පාදන අනුමත කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට වගකීම සහ අධිකාරිය.
3. ඖෂධ නිෂ්පාදනවල ස්ථායීතාව නිරීක්ෂණය කිරීම සහ කල් තබා ගත හැකි කාලය පුරාවට එහි ගුණාත්මකභාවය සහතික කිරීම, අනුකූල වීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ වත්මන් යහපත් නිෂ්පාදන පුරුදු (cGMP) නිරීක්ෂණය කිරීම.
4. මිලදී ගත යුතු ආරම්භක ද්‍රව්‍ය, ඇසුරුම් ද්‍රව්‍ය සඳහා පිරිවිතර අනුමත කිරීම.
5. නිෂ්පාදන අංශයේ යහපත් නිෂ්පාදන පුරුදු අධීක්ෂණය කිරීම සහ නිෂ්පාදන ක්‍රියාකාරිත්වයේ දී සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය (SOP) සමඟ අනුකූල වීම අධීක්ෂණය කිරීම.
6. ජලයේ ගුණාත්මකභාවය සහ අපජල පද්ධතිය අධීක්ෂණය කිරීම.
7. වෙළඳපොලේ සිටින තරඟකරුවන්ගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය නිරීක්ෂණය කර අපගේ නිෂ්පාදන සමඟ සැසඳීම සහ අවශ්‍ය වුවහොත් අපගේ නිෂ්පාදන වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශ ලබා දීම.
8. වෙළඳපල පැමිණිලි සඳහා සුදුසු පියවර ගැනීම.

9. විශ්ලේෂණ ක්‍රියා පටිපාටි ඇතුළුව සුදුසු වලංගුභාවයට පත් කිරීම් සහ උපකරණ ක්‍රමාංකන පාලනය කිරීම සිදු කර ඇති බවට සහතික වීම.

10. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

11. නිෂ්පාදන අංශයේ cGMP ක්‍රියාත්මක කිරීමට අධීක්ෂණය සහ සහාය වීම සහ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ තත්ත්ව කළමනාකරණ පද්ධතිය සඳහා අනුගත වීම.

**සුදුසුකම්** : **බාහිර අපේක්ෂකයින්**

අ) (i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයකින් ලබා ගත් පළමු හෝ දෙවන පන්තිය සහිතව රසායන විද්‍යාව විෂය ඇතුලත්ව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ සමාන සුදුසුකම්.

හෝ

(ii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයකින් ලබා ගත් රසායන විද්‍යාවේ විද්‍යාවේදී විශේෂ උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ සමාන සුදුසුකම්.

හෝ

(iii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයකින් රසායන විද්‍යාව විෂය ඇතුලත්ව ලබා ගත් විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ සමාන සුදුසුකම්.

සහ

ආ) (i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයකින් ලබා ගත් විශ්ලේෂණ රසායන විද්‍යා විෂය ක්ෂේත්‍රයට අදාළ හෝ ඖෂධ පිළිබඳ ඕනෑම විද්‍යාත්මක පරීක්ෂණ / විශ්ලේෂණ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම.

හෝ

(ii) රසායන විද්‍යාතනයේ ආයතනික සාමාජිකත්වය

සහ

ඇ) රජයේ/ රාජ්‍ය සංස්ථාවක/ මණ්ඩලයක /ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක ඖෂධ / ආහාර ක්ෂේත්‍රයේ විද්‍යාත්මක ඇගයීම්/ රසායනාගාර පරීක්ෂණ/ නිෂ්පාදන හා පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළ කළමනාකරණ මට්ටමේ (MM 1-1) අවම වශයෙන් වසර 12 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද ලබා තිබීම.

**සුදුසුකම් : අභ්‍යන්තර අපේක්ෂකයින්**

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක කළමණාකාර මට්ටමේ (MM 1-1) I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර දෙකක (02) සතුටුදායක අඛණ්ඩ සේවය

වැටුප් පරිමාණය : HM 1-1 - රු. [140,640 – 15 x 4,100 = 202,140]
(MSD චක්‍රලේඛ අංක 01/2025 හි II වන උපලේඛනයට අනුව, රු. 140,640 /= ක මූලික වැටුප 2027.01.01 දින සිට ගෙවනු ලබන අතර 2026 වර්ෂය සඳහා ආරම්භක වැටුප රු. 123,019/= කි.)

ඉහත වැටුප් වලට අමතරව, රජයේ අනුමත දීමනා ද ගෙවනු ලැබේ.

වයස : අවුරුදු 35ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 55ට වැඩි නොවිය යුතුය.
අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

බඳවාගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**අනෙකුත් ප්‍රතිලාභ**

- සංස්ථාව විසින් නඩත්තු කරනු ලබන නිල වාහනයක් හෝ අංක PED 1/2015 (i) චක්‍රලේඛය ප්‍රකාරව තමන්ගේ වාහනය සඳහා දීමනාවක්
- ඉන්ධන දීමනාව (මාසිකව ඩීසල් හෝ පෙට්‍රල් ලීටර් 120ක්)

## (2) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධන තනතුර - (HM 1-1)

**රාජකාරි:**

වට්ටෝරු, පර්යේෂණ සහ සංවර්ධන අංශයේ ප්‍රධානී ලෙස රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වට්ටෝරු, පර්යේෂණ සහ සංවර්ධන කටයුතුවලට අදාළ සියලු කටයුතු සඳහා සභාපති/කළමණාකාර අධ්‍යක්ෂ සහ සාමාන්‍යාධිකාරී වෙත වගකිව යුතුය.

1. යටත් කාර්ය මණ්ඩලයට නව නිෂ්පාදන සැකසීම්, ක්‍රම සංවර්ධනය සහ වලංගුභාවයට පත් කිරීම් පිළිබඳ මාර්ගෝපදේශ සහ උපදෙස් ලබා දීම.
2. නව නිෂ්පාදන ලියාපදිංචි කිරීම සඳහා මාර්ගෝපදේශ සැපයීම.
3. නිෂ්පාදන පරිමාණය දක්වා පරිමාණය කිරීම සහ ක්‍රියාවලි වලංගු කිරීම.
4. ක්‍රියාවලි වැඩිදියුණු කිරීම, තත්ත්ව වැඩිදියුණු කිරීම සහ ඵලදායිතා වැඩිදියුණු කිරීම පිළිබඳ තාක්ෂණික උපදෙස් ලබා දීම.
5. ආරම්භක ද්‍රව්‍ය මිලදී ගැනීමේදී සලකා බැලිය යුතු තත්ත්ව පිරිවිතර නිර්ණය කිරීම.

6. පවතින නිෂ්පාදන හා සම්බන්ධ කඩින් කඩ නිෂ්පාදන ගැටළු නිරාකරණය කිරීම සඳහා උපදෙස් ලබා දීම සහ විසඳුම් ලබා දීම.

7. දෙපාර්තමේන්තුවේ සංවර්ධන සැලසුම් ඇගයීම සහ සලකා බැලීම සහ අනුමැතිය සඳහා සාමාන්‍යාධිකාරී වෙත යොමු කිරීම.

8. නිෂ්පාදන සංවර්ධනය සහ වැඩිදියුණු කිරීම් ආශ්‍රිත පර්යේෂණ ව්‍යාපෘති සඳහා අධීක්ෂණය සැපයීම.

9. අවශ්‍ය වූ විට සහ වෙනත් ආයතනවල සහයෝගීතාවයෙන් සායනික පරීක්ෂණ, / ජෛව උපයෝගීතා අධ්‍යයනයන් ආරම්භ කිරීම.

10. නිෂ්පාදන අංශයේ යහපත් නිෂ්පාදන පුරුදු ක්‍රියාත්මක කිරීමට අධීක්‍ෂණය සහ සහාය වීම සහ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ තත්ත්ව කළමනාකරණ පද්ධතිය සඳහා අනුගත වීම.

**සුදුසුකම් : බාහිර අපේක්ෂකයින්**

ඇ) (i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයකින් ලබා ගත් පළමු හෝ දෙවන පන්තිය සහිතව රසායන විද්‍යාව විෂය ඇතුලත්ව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ සමාන සුදුසුකම්.

හෝ

(ii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයකින් ලබා ගත් රසායන විද්‍යාවේ විද්‍යාවේදී විශේෂ උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ සමාන සුදුසුකම්.

හෝ

(iii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයකින් රසායන විද්‍යාව විෂය ඇතුලත්ව ලබා ගත් විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ සමාන සුදුසුකම්.

සහ

ආ) (i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයකින් ලබා ගත් විශ්ලේෂණ රසායන විද්‍යා විෂය ක්ෂේත්‍රයට අදාළ හෝ ඖෂධ පිළිබඳ ඕනෑම විද්‍යාත්මක පරීක්ෂණ / විශ්ලේෂණ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම.

හෝ

(ii) රසායන විද්‍යාතනයේ ආයතනික සාමාජිකත්වය

සහ

ඇ) රජයේ/ රාජ්‍ය සංස්ථාවක/ මණ්ඩලයක /ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක ඖෂධ / ආහාර ක්ෂේත්‍රයේ විද්‍යාත්මක ඇගයීම්/ රසායනාගාර පරීක්ෂණ/ නිෂ්පාදන හා පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළ කළමනාකරණ මට්ටමේ (MM 1-1) අවම වශයෙන් වසර 12 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද ලබා තිබීම.

**සුදුසුකම්** : **අභ්‍යන්තර අපේක්ෂකයින්**

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක කළමණාකාර මට්ටමේ (MM 1-1) I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර දෙකක (02) සතුටුදායක අඛණ්ඩ සේවය

වැටුප් පරිමාණය : HM 1-1 - රු. [140,640 – 15 x 4,100 = 202,140]
(MSD චක්‍රලේඛ අංක 01/2025 හි II වන උපලේඛනයට අනුව, රු. 140,640 /= ක මූලික වැටුප 2027.01.01 දින සිට ගෙවනු ලබන අතර 2026 වර්ෂය සඳහා ආරම්භක වැටුප රු. 123,019/= කි.)

ඉහත වැටුප් වලට අමතරව, රජයේ අනුමත දීමනා ද ගෙවනු ලැබේ.

වයස : අවුරුදු 35ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 55ට වැඩි නොවිය යුතුය.
අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

බඳවාගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**අනෙකුත් ප්‍රතිලාභ**

- සංස්ථාව විසින් නඩත්තු කරනු ලබන නිල වාහනයක් හෝ අංක PED 1/2015 (i) චක්‍රලේඛය ප්‍රකාරව තමන්ගේ වාහනය සඳහා දීමනාවක්
- ඉන්ධන දීමනාව (මාසිකව ඩීසල් හෝ පෙට්‍රල් ලීටර් 120ක්)

## (3) කළමණාකරු - අලෙවි - (MM 1-1– II ශ්‍රේණිය)

**සුදුසුකම්: බාහිර අපේක්ෂකයින්**

(අ) (i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් විද්‍යාව / වාණිජ්‍යය / අලෙවිකරණය / ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක්,

හෝ

(ii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් /ආයතනයකින් ලබා ගත් වෙනත් සමාන උපාධියක්,

සහ

(ආ) පරිගණක සාක්ෂරතාවය.

සහ

(ඇ) රාජ්‍ය / සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ කීර්තිමත් වෙළඳ ආයතනයක විකුණුම් හෝ අලෙවිකරණ ක්ෂේත්‍රයට අදාළව අවම වශයෙන් අවුරුදු 05 ක සුදුසුකම් ලැබීමෙන් පසු පළපුරුද්ද.

**සුදුසුකම්** : **අභ්‍යන්තර අපේක්ෂකයින්**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වූ අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

හෝ

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරු (JM 1-1) කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

- වැටුප් පරිමාණය : MM 1-1 - රු. [91,690 – 10 x 2,480 – 15 x 3,450 = 168,240]
  (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි II වන උපලේඛනයට අනුව, රු. 91,690/= ක මූලික වැටුප 2027.01.01 දින සිට ගෙවනු ලබන අතර 2026 වර්ෂය සඳහා ආරම්භක වැටුප රු. 81,710/= කි.)

  ඉහත වැටුප් වලට අමතරව, රජයේ අනුමත දීමනා ද ගෙවනු ලැබේ.

- වයස : අවුරුදු 22ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 45ට වැඩි නොවිය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

- බඳවාගැනීමේ ක්‍රමය : ලිඛිත තරග විභාගයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## (4) රසායනඥ - (JM 1-1 – II ශ්‍රේණිය)

**සුදුසුකම්: බාහිර අපේක්ෂකයින්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් රසායන විද්‍යාව හෝ ඖෂධවේදය පිළිබඳ විෂයයක් ඇතුළුව විද්‍යාව පිළිබඳ උපාධියක්.

සටහන: විශ්ලේෂණාත්මක රසායන විද්‍යාව පිළිබඳ පසුබිම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**සුදුසුකම්** : **අභ්‍යන්තර අපේක්ෂකයින් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වූ අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

හෝ

2. තනතුරg අදාළ විෂය ක්ෂේත්‍රයේ "කළමනාකරණ සහකාර -තාක්ෂණික" (MA 2-1) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක් (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

- වැටුප් පරිමාණය : JM 1-1 - රු. [72,650 – 10 x 1,360 – 18 x 2,040 = 122,970]
  (MSD චක්‍රලේඛ අංක 01/2025 හි II වන උපලේඛනයට අනුව, රු. 72,650 /= ක මූලික වැටුප 2027.01.01 දින සිට ගෙවනු ලබන අතර 2026 වර්ෂය සඳහා ආරම්භක වැටුප රු. **65,633**/= කි.)

- වයස : අවුරුදු 22ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 45ට වැඩි නොවිය යුතුය.
  අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

- බඳවාගැනීමේ ක්‍රමය : ලිඛිත තරග විභාගයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## (05) ප්‍රවාහන නිලධාරි - (JM 1-1 – II ශ්‍රේණිය)

**සුදුසුකම් : බාහිර අපේක්ෂකයින්**

අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක යාන්ත්‍රික/මෝටර් රථ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධිය.

හෝ

ආ) තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 7 ට (NVQ 7) සමාන යාන්ත්‍රික / මෝටර් රථ ඉංජිනේරු පාඨමාලාව.

හෝ

ඇ) තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 6 ට (NVQ 6) සමාන යාන්ත්‍රික / මෝටර් රථ ඉංජිනේරු පාඨමාලාව.

සහ

රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා/මණ්ඩල/ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක මෝටර් රථ ප්‍රවාහන වාහන ඇණිය කළමනාකරණය කිරීමේ තාක්ෂණික හා පරිපාලන ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්ද.

හෝ

ඇ) තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 ට (NVQ 5) සමාන යාන්ත්‍රික / මෝටර් රථ ඉංජිනේරු පාඨමාලාව.

සහ

රජයේ දෙපාර්තමේන්තුවක/සංස්ථාවක/මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක මෝටර් රථ ප්‍රවාහන වාහන ඇණිය නඩත්තු කිරීම පිළිබඳ තාක්ෂණික හා පරිපාලන ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර

දහයක (10) පශ්චාත් සුදුසුකම් ලැබීමේ පළපුරුද්ද සහ කළමනාකරණය කරන මෝටර් රථ ප්‍රවාහන වාහන ඇණිය භාරව අවම වශයෙන් වසර පහක අධීක්ෂණ ධාරිතාවක් තිබීම.

සහ

ඉ) පරිගණක සාක්ෂරතාවය

**සුදුසුකම් : අභ්‍යන්තර අපේක්ෂකයින් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම

2. තනතුරg අදාළ විෂය ක්ෂේත්‍රයේ "කළමනාකරණ සහකාර -තාක්ෂණික" (MA 2-1) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක් (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

- වැටුප් පරිමාණය : JM 1-1 - **රු.** [72,650 – 10 x 1,360 – 18 x 2,040 = 122,970] (MSD චක්‍රලේඛ අංක 01/2025 හි II වන උපලේඛනයට අනුව**,** රු. 72,650 /= ක මූලික වැටුප 2027.01.01 දින සිට ගෙවනු ලබන අතර 2026 වර්ෂය සඳහා ආරම්භක වැටුප රු. **65,633**/= කි.)

- වයස් සීමාව : අවුරුදු 22ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 45ට වැඩි නොවිය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

- බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත තරග විභාගයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## (06) තාක්ෂණික සහකාර - වට්ටෝරු, පර්යේෂණ සහ සංවර්ධන (MA -2-1 – III ශ්‍රේණිය)

**සුදුසුකම් : බාහිර අපේක්ෂකයින් [පහත (අ) ,(ආ) හෝ (ඇ) ]**

(අ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ඖෂධ නිෂ්පාදන ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 ට (NVQ 5) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාගෙන තිබීම.

(ආ) (i) අ.පො.ස (සා.පෙළ) විභාගයේදී සිංහල/දෙමළ, විද්‍යාව, ඉංග්‍රීසි සහ ගණිතය ඇතුළුව සම්මාන 04ක් සමඟ විෂයයන් 06ක් සමත් වීම.

සහ

(ii) අ.පො.ස (උ.පෙළ) විභාගයේදී රසායන විද්‍යාව (සාමාන්‍ය ප්‍රශ්න පත්‍රය හැර) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව සම්මාන 2ක් සමඟ තනතුරට අදාළ විද්‍යා හෝ තාක්ෂණික විෂයයන් තුනක් (03) සමත් වීම.

සහ

(iii) මාස හයකට නොඅඩු පරිගණක පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

සහ

(iv) පිළිගත් රසායනාගාරයක අවම වශයෙන් අවුරුදු දෙකක (2) විශ්ලේෂණ පළපුරුද්ද.

(ඇ) පුහුණුවන්නන් බඳවා ගැනීම

ඉහත (ආ) (i), (ii) සහ (iii) සුදුසුකම් සහිත අයවලුන් පුහුණුවන්නන් ලෙස බඳවා ගැනීම

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ පුහුණුවන තාක්ෂණික සහකාරවරයෙකු ලෙස වසර 1 ½ ක සේවාස්ථ පුහුණු කාලය සම්පූර්ණ කිරීම සහ ලිඛිත පරීක්ෂණය සමත් වීම තාක්ෂණික සහකාර ලෙස ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කිරීම සඳහා පූර්ව අවශ්‍යතා වේ.

**සුදුසුකම් : අභ්‍යන්තර අපේක්ෂකයින්**

ඉහත බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම

- වැටුප් පරිමාණය : MA 2-1 : රු. [50,540 – 10 x 540 – 7x 630 – 4 x 890 -20 x 1,190 – 87,710] (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන II ට අනුව, රු. 50,540/= ක මූලික වැටුප 2027.01.01 දින සිට ගෙවනු ලබන අතර 2026 වර්ෂය සඳහා ආරම්භක වැටුප රු. 46,960/= කි)

- වයස : අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
  අභ්‍යන්තර අයදුම්කරුවන්ට ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

- බඳවා ගැනීමේ ක්‍රමය: ලිඛිත තරඟ විභාගයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## (07) තත්ත්ව සහතික සහකාර - (MA 2-1 – III ශ්‍රේණිය)

**සුදුසුකම් : බාහිර අපේක්ෂකයින් [පහත (අ) ,(ආ) හෝ (ඇ) ]**

අ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ඖෂධ නිෂ්පාදන ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 ට (NVQ 5) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාගෙන තිබීම.

ආ) (i) අ.පො.ස (සා.පෙළ) විභාගයේදී සිංහල/දෙමළ, විද්‍යාව, ඉංග්‍රීසි සහ ගණිතය ඇතුළුව සම්මාන 04ක් සමඟ විෂයයන් 06ක් සමත් වීම.

සහ

(ii) අ.පො.ස (උ.පෙළ) විභාගයේදී රසායන විද්‍යාව (සාමාන්‍ය ප්‍රශ්න පත්‍රය හැර) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව සම්මාන 2ක් සමඟ තනතුරට අදාළ විද්‍යා හෝ තාක්ෂණික විෂයයන් තුනක් (03) සමත් වීම.

සහ

(iii) මාස හයකට නොඅඩු පරිගණක පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

සහ

(iv) පිළිගත් ඖෂධ / ආහාර නිෂ්පාදන ආයතනයක තත්ත්ව සහතික ක්ෂේත්‍රයට අදාළ අවම වශයෙන් අවුරුදු දෙකක (2) පළපුරුද්ද.

ඇ) පුහුණුවන්නන් බඳවා ගැනීම

ඉහත (ආ) (i), (ii) සහ (iii) සුදුසුකම් සහිත අයවලුන් පුහුණුවන්නන් ලෙස බඳවා ගැනීම.

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ පුහුණුවන තත්ත්ව සහතික සහකාරවරයෙකු ලෙස වසර 1 ½ ක සේවාස්ථ පුහුණු කාලය සම්පූර්ණ කිරීම සහ ලිඛිත පරීක්ෂණය සමත් වීම තත්ත්ව සහතික සහකාර ලෙස ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කිරීමට පූර්ව අවශ්‍යතා වේ.

**සුදුසුකම් : අභ්‍යන්තර අපේක්ෂකයින්**

ඉහත බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම

- වැටුප් පරිමාණය : MA 2-1 : රු. [50,540 – 10 x 540 – 7x 630 – 4 x 890 -20 x 1,190 – 87,710] (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන II ට අනුව, රු. 50,540/= ක මූලික වැටුප 2027.01.01 දින සිට ගෙවනු ලබන අතර 2026 වර්ෂය සඳහා ආරම්භක වැටුප රු. 46,960/= කි)
- වයස : අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට ඉහළ වයස් සීමාව අදාළ නොවේ.
- බඳවා ගැනීමේ ක්‍රමය: ලිඛිත තරඟ විභාගයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## (08) ඖෂධ නිමාකිරීමේ සහායක (PL -2 – III ශ්‍රේණිය)

**සුදුසුකම් : බාහිර අපේක්ෂකයින් (පහත 1, 2, හෝ 3)**

(1) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ඖෂධ ඇසුරුම්කරණයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 2 ට (NVQ 2) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

(2) සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි විෂයයන් සඳහා සම්මාන 04ක් සමඟින් අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් විෂයන් හයක් (06) සමත් වී තිබීම.

සහ

ඖෂධ ඇසුරුම්කරණයේ වසරක පළපුරුද්ද.

(3) පුහුණුවන්නන් බඳවා ගැනීම

සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි විෂයයන් සඳහා සම්මාන 04ක් සමඟින් අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් විෂයන් හයක් (06) සමත් වී තිබීම.

සහ

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ පුහුණුවන ඖෂධ නිමාකිරීමේ සහායක ලෙස වසරක පුහුණු කාලයක් සම්පූර්ණ කළ පසු ඖෂධ නිමාකිරීමේ සහායක ලෙස ස්ථිර සේවයට බඳවාගනු ලැබේ.

**අභ්‍යන්තර අපේක්ෂකයින් (පහත** 1 හෝ 2)

**1.** ඉහත බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

**2.** වෘත්තීය පරීක්ෂණයකින් සනාථ කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම **2** ට (NVQ 2) නොඅඩු නිපුණතාව සමග අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර ඇති නුපුහුණු මට්ටමේ සේවකයින්.

- වැටුප් පරිමාණය : PL-2 - රු. 42,300/= – 10 x 490 - 10 x 540-10x 590- 12 x 630– 66,060/= (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි II වන උපලේඛනයට අනුව, රු. 42,300/= ක මූලික වැටුප 2027.01.01 දින සිට ගෙවනු ලබන අතර 2026 වර්ෂය සඳහා ආරම්භක වැටුප රු. 40,008/= කි)

- වයස : අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

- බඳවා ගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**ආන්තික ප්‍රතිලාභ:**

- පැමිණීමේ සහ කාර්ය සාධන දිරිදීමනා.
- උපයෝගී කර නොගත් වාර්ෂික සහ අසනීප නිවාඩු සඳහා මුදල් ගෙවීම.
- වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සහ වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය.
- සංස්ථාව විසින් වැටුපෙන් 15%ක් හා සේවකයා 10%ක් වශයෙන් සේවක අර්ථසාධක අරමුදලට දායක වීම.
- සංස්ථාව විසින් වැටුපෙන් 3%ක් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක වීම.
- 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා පනත සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) චක්‍රලේඛයට අනුව පාරිතෝෂිකය ගෙවනු ලැබේ.

- වෙනත් ආන්තික ප්‍රතිලාභ.

**පොදු උපදෙස්:**

- නියමිත ආකෘති පත්‍ර වල සකසන ලද අයදුම්පත් ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ විමසුම් විස්තර සමඟ ඉදිරිපත් කළ යුතුය. සියලුම අධ්‍යාපන සහතිකවල සහතික කළ පිටපත් අයදුම්පත්‍රය සමඟ අමුණා තිබිය යුතුය. අදාළ අයදුම් පත්‍රය ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිල වෙබ් අඩවිය වන https://www.spmc.gov.lk වෙතින් බාගත කර ගත හැකිය.

- රජයේ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ ආයතන ප්‍රධානීන් හරහා යොමු කළ යුතු අතර, ඔවුන් තෝරාගනු ලැබුවහොත්, පත්වීම ලබා ගැනීම සඳහා අයදුම්කරු නිදහස් කළ හැකිද යන්න සහතික කළ යුතුය.

- ඉල්ලුම් කරන තනතුර අයදුම්පත බහාලු ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතු අතර, අයදුම්පත් මෙම දැන්වීම පළ වී දින 10ක් ඇතුළත පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

- ඉහත අවශ්‍යතාවලට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- අයදුම්කරුවෙකු තනතුරු එකකට වඩා අයදුම් කරන්නේ නම්, එක් එක් තනතුරු සඳහා සහතික වල පිටපත් සමග වෙන වෙනම ලියුම් කවර වල බහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

**සභාපති**
**රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව**
**අංක 11, සර් ජෝන් කොතලාවල මාවත**
**කඳවල වත්ත - රත්මලාන.**
22.02.2026